# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2014 නොවැම්බර් මස 18 වන දින පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්, ජලසම්පාදන හා ජලාපවහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් 2014.06.03 දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/VI (1) /14/03)

අ. පළාත් මාර්ග ගණනාවක් සංවර්ධනය කිරීමේදී මාර්ග දෙපස ජනතාව වන්දි ලබා ගැනීමකින් තොරව තම ඉඩමේ ප්‍රමාණයක් පාර සංවර්ධනයට නිදහස් කළ ස්ථාන ඇති බව පිළිගන්නේද?

ආ. එකී ස්ථානවල මාර්ගය පුළුල් කළද, විදුලි කණු, දුරකථන කණු, එලෙසින්ම පවතින බව පිළිගන්නේද?

ඇ. මාර්ගය ලෙස භාවිතා වන සීමාවේ, මෙම කණු පැවතීමෙන් එය අනතුරුදායක තත්වයක් බව පිළිගන්නේද?

ඈ. එකී අනතුරුදායක තත්වය වෙනස් කිරීමට ගන්නා වූ පියවර කවරේද?

ඉ. නොඑසේ නම් ඒ මන්ද?

02. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළද විෂය භාර අමාත්‍යතුමාගෙන් 2014.11.04දින අසන ලද ප්‍රශ්ණය:

(ප්‍ර/VI (1) /14/46)

අ. කොළඹ අධ්‍යාපන කලාපයේ පළාත් සභා පාසල් ගණන කියද?

ආ. එම පාසල්වල 2,3,4 හා 5 ශ්‍රේණිවල අකුරු ලිවීමේ හා කියවීමේ හැකියාව නොමැති මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කියද?

ඇ. එම පාසල් හා ශ්‍රේණි වලට අනුව කියවීමට හා ලිවීමට නොහැකි ප්‍රමාණය පිළිබඳව වාර්තාවක් ලබා දෙන්නේද?

ඈ. නොඑසේනම් ඒ මන්ද?

03. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති, හා වෙළද විෂය භාර අමාත්‍යතුමාගෙන් 2014.11.04 දින අසන ලද ප්‍රශ්ණය:

(ප්‍ර/VI (1) /14/47)

අ. ගම්පහ අධ්‍යාපන කලාපයේ පළාත් සභා පාසල් ගණන කියද?

ආ. එම පාසල්වල 2,3,4 හා 5 ශ්‍රේනි වල අකුරු ලිවීමේ හා කියවීමේ හැකියාව නොමැති මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කියද?

ඇ. එම පාසල් හා ශ්‍රේණිවලට අනුව කියවීමට හා ලිවීමට නොහැකි ප්‍රමාණය පිළිබඳව වාර්තාවක් ලබා දෙන්නේද?

ඈ. නොඑසේනම් ඒ මන්ද?

04. ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂනායකතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළද විෂය භාර අමාත්‍යතුමාගෙන් 2014.11.04 දින අසන ලද ප්‍රශ්ණය:

(ප්‍ර/VI (1) /14/51)

අ. හොරණ අධ්‍යාපන කලාපයේ ඔලබොඩුව සුමංගල මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා එම තනතුර සදහා සුදුසුකම් සපුරා ඇත්තේද? එම සුදුසුකම් සඳහන් කරන්නේද?

ආ. විදුහල්පතිවරයා සිය අත්තනෝමතික තීරණ මත, පාසැලේ ගුරු භවතුන් ස්ථානමාරු කරමින්, ජාතික ගුරු මාරු ප්‍රතිපත්ති, දෙපාර්තුමේන්තු චක්‍ර ලේඛන, ආයතන සංග්‍රහයේ විධි විධාන කඩකර ඇති බව පිළිගන්නේද?

ඇ. මොහුට හිතවත් අතිරික්ත ගුරුවරුන් 17 දෙනෙකු පාසැලේ රදවා ගෙන ඇති බව දන්නේද?

ඈ. පාසැලේ මුදල් වියදම් කිරිමේදි සිදුව ඇති අක්‍රමිකතා පිළිබදව පරීක්ෂණයක් කරන්නේද?

ඉ. තම විෂයන්ට අදාල ගුරුවරුන් වෙනත් විෂයන් ඉගැන්වීමට යෙදවීම, විදුහල්පතිවරයාට හිතවත් ගුරුවරුන් රාජකාරි වලින් නිදහස් කිරිම, ප්‍රාථමික අංශයේ ගුරුවරුන් ඉහල ශ්‍රේණිවල අධ්‍යාපන කටයුතු සදහා යෙදවීම, ජ්‍යෙෂ්ඨ ගුරුවරුන් අධීක්ෂණය සදහා නවක ගුරුවරුන් යෙදවීම, ආදි පාසැල් පරිපාලනයේ විවිධ අක්‍රමිකතා සිදුවන බව දන්නේද?

ඊ. ගුරු සංගමයක ලේකම් යැයි කියා ගන්නා මොහු, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් පවා අභිබවායමින්, ගුරුවරුන් විවිධ හිංසනයට ලක්කිරිම පිළිබදව, සුදුසු පියවරක් ගන්නේද?

උ. අධ්‍යාපන ක්ෂේත්‍රය දේශපාලණීකරණය වීමෙන් ගුරුවරුන් විවිධ අපහසුතාවලට ලක්වීම මෙන්ම දරුවන්ගේ අධ්‍යාපනය අඩාල වීම පිළිබදව සුදුසු පියවර ගන්නේද? නොඑසේනම් ඒ මන්ද?

05. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2014.11.04 දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/VI (1) /14/53)

අ. i. අන්තර් පළාත් ස්ථාන මාරු යටතේ අප පළාතට ගුරුවරුන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය කුමක්ද?

ii. වෙනත් පළාත් වලින් ස්ථාන මාරු නිර්දේශ ලැබ පැමිණෙන ගුරුවරුන් මෙම වර්ෂය තුළ (2014) මෙම පළාතට බඳවාගෙන තිබේද?

iii. එසේ බඳවාගෙන තිබේනම් ඒ කොපමණ සංඛ්‍යාවක්ද?

iv. එසේ බඳවාගත් ගුරුවරුන් බඳවාගත් පදනම කුමක්ද?

v. එසේ බඳවාගත් ගුරු වර්ග මොනවාද? කොපමණ සංඛ්‍යාව බැගින්ද?

ආ. I. පළාත් පාසල් සේවයේ නියුතු ගුරුවරුන් ජාතික පාසල් සේවයට මුදා හරින්නේ කුමන ප්‍රතිපත්තියක් මත පිහිටාද?

ii. මෙම වර්ෂය තුළ පළාත් පාසල් සේවයෙන් ජාතික පාසල් සේවයට මුදාහල ගුරු සංඛ්‍යාවන් ඒ ඒ ගුරු වර්ගය අනුව කොපමණද?

iii. ජාතික පාසල් සේවයට පළාත් පාසල් සේවයේ නියුතු ගුරුවරුන් මුදාහරින ක්‍රමවේදය, විනිවිදව හා ක්‍රමවත්ව ක්‍රියාත්මක කරන්නේද?

06. කාර්ය පටිපාටි රීති අංක 31 අ. (1) හි විධිවිධාන අනුව පිළිතුරු දීමට කල්ගන්නා ලද ප්‍රශ්නය:

- ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති, හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන්, 2014.11.04 දින සභා කල්තබන අවස්ථාවේදී අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/VI (1) /14/ ADJ/02)

අ. I. බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් බස්නාහිර පළාතේ පාසල්වලට, වර්ණාලේප කිරීම සඳහා කොපමණ මුදලක් ලබාදී තිබේද?

ii. පාසල් අනුව කුමන ප්‍රමාණ වලින් එම මුදල් ලබාදී තිබේද?

iii. එම මුදල් ලබාදීම සඳහා පළාත් සභා මන්ත්‍රීවරුන් සහභාගී කරවාගෙන පාසල්වල උත්සව පවත්වන ලෙස ඔබතුමා විසින් උපදෙස් ලබාදී තිබේද?

iv. එම උත්සව මගින් පාසල් ඉගෙනුම් ක්‍රියාවලියට බාධා වන බව ඔබතුමා පිළිගන්නේද?

v. මේ දිනවල සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් සඳහා විභාග දෙපාර්තමේන්තුවෙන් ලබාදී ඇති ප්‍රශ්ණ පත්‍ර සාකච්ඡා කිරීමේ සම්මන්ත්‍රණ පැවැත්වෙන බව ඔබතුමා දන්නේද?

vi. ඉහත කී උත්සව මගින් මෙම සම්මන්ත්‍රණ වලට බාධා සිදුවන බව ඔබතුමා පිළිගන්නේද?

vii. පාසල්වල සංවිධානය කරනු ලබන මෙම උත්සව වලින් 2014 නොවැම්බර් 10 වැනි හා 19 වැනි දින ආරම්භ වීමට නියමිත වාර විභාග සඳහා බාධා වන බව ඔබතුමා පිළිගන්නේද?

07. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට : (ප්‍ර/VI (1) /14/54)

අ. මහරගම විද්‍යාකර බාලිකා විද්‍යාලයේ පුරප්පාඩු වු විදුහල්පති තනතුරට මෑතදී පත්කර ඇති විදුහල්පතිවරිය සම්බන්ධව පාසල තුළ විරෝධයක් හටගෙන ඇති බව ඔබතුමා දන්නේද?

ආ. මෙම පාසල පාසල් වර්ගීකරණය යටතේ කුමන ගණයේ ලා සැළකෙන පාසලක්ද?

ඇ. මෙම ගණයේ ලා සැළකෙන පාසලකට පුරප්පාඩු වු විදුහල්පති ධූරය සඳහා විධිමත් පත්වීම් සිදුකිරීමේදී කවර සේවාවන්හි කවර ශ්‍රේණිධාරියෙකුට ඒ සඳහා අයදුම් පත් ඉදිරිපත් කළ හැකි වන්නේද?

ඈ. ඒ සඳහා ප්‍රතිපාදන සලසා ඇති චක්‍රලේඛ කවරේද?

ඉ. පාසලක පුරප්පාඩු විදුහල්පති ධූරයක් සඳහා අයෙකු තෝරා ගැනීමේදී හා පත්කිරීමේදී අනුගමනය කළ යුතු විධිමත් ක්‍රියා පටිපාටියක් පවතිද?

ඊ. එසේ නම් එය කුමක්ද?

උ. මහරගම විද්‍යාකර බාලිකා විද්‍යාලයට අදාළව මෙකී ක්‍රියා පටිපාටිය අනුගමනය කළේද?

ඌ. එසේනම් ඊට අදාළ ලිපි ලේඛන, සම්මුඛ පරීක්ෂණ ලකුණු ලැයිස්තු හා වාර්තා සියල්ල මේ සභාවට ඉදිරිපත් කරන්නේද?

08. ගරු අනුරුද්ධ ලේකම්ගේ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට : (ප්‍ර/VI (1) 14/55)

අ. බස්නාහිර පළාත තුළ ඇති ජාත්‍යන්තර පාසල් ගණන කොපමණද?

ආ. එම සියළුම පාසල් බස්නාහිර පළාත් සභාවේ ලියාපදිංචි වී තිබේද?

ඇ. එම ජාත්‍යන්තර පාසල් රජයේ පාසල් මෙන්ම යම් කිසි වර්ගීකරණයකට ලක්කර තිබේද?

ඈ. එම පාසල් පළාත් සභාවේ හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන නීති රෙගුලාසිවලට යටත්ද?

ඉ. එම පාසල්වල විදුහල්පති ඇතුළු ගුරු මණ්ඩලයේ සුදුසුකම් ගැන පළාත් සභාවෙන් සොයා බැලීමක් කරන්නේද?

ඊ. ගුරු පුහුණු පාසල් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදෙන්නේ පළාත් සභාවෙන්ද? අධ්‍යාපන අමාත්‍යාංශයෙන්ද?

උ. පුහුණුව ලබාගත් ගුරුවරුන්ට ගුරු සහතිකය ලබා දෙන්නේ කුමන ආයතනයෙන්ද?

ඌ. එම පාසල් සඳහා වාරිකව අය කරන මුදල් ගැන සහ දරුවන් ඇතුළත් කිරීමේදී අය කරන මුදල් ගැන පළාත් සභාව සොයා බැලීමක් කරන්නේද?

එ. පන්තිවල සිටිය යුතු ළමයින් ගණන වැනි නීති එම පාසල් වලට බලපාන්නේද?

ඒ. එම පාසල්වල ඉගෙන්ම ලබන දරුවන් වෙනුවෙන් එම පාසල්වල ඇති යටිතල පහසුකම් පිළිබඳව සොයා බැලීම සඳහා පළාත් සභාවෙන් පරීක්ෂක කණ්ඩායමක් පත්කර තිබේද?

09. ගරු කේ. බී. අරුණ දීපාල් මන්ත්‍රීතුමා විසින්, ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට :

(ප්‍ර/VI (1) 14/56)

(අ) i 2013 වර්ෂය තුළ බස්නාහිර පළාතේ පාසල් තුළ ඉගෙනුම ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව එක් එක් කලාප වශයෙන් කොපමණද?

ii එම වර්ෂයේ ශිෂ්‍ය ජනගහණයෙන් පාසැල් හැර ගිය *(විවිධ හේතු මත)* සංඛ්‍යාව කොපමණද?

iii එම දරුවන් එසේ පාසැල් හැරයාමට හේතු වූ කරුණු පිළිබඳව සොයා බැලීමට යම් අධ්‍යයන හා විපරම් කාර්යයක් සිදු කරනු ලැබුවේද?

iv එසේ නම්, එකී අධ්‍යයනයේදී පාසල් හැරයාමට හේතු වූ කරුණු හඳුනා ගෙන ඇත් ද? ඒ මොනවාද?

v එම හේතු සඳහා පිළියම් යෙදීමට හා පාසල් හැරයාමේ සංඛ්‍යාව අවම කිරීමට ගෙන ඇති වැඩ පිළිවෙල සහ එහි ප්‍රගතිය කෙබඳුද?

ආ) i සියුත් පාසල් හැරයාම බහුල කලාප හෝ කොට්ඨාශ හඳුනා ගෙන ඇත් ද?

ii එම තත්වයට බලපාන ලද පොදු හේතු වලට අමතර විශේෂ වෙනත් හේතු හඳුනා ගෙන ඇත්ද?

iii එසේ නම්, එම හේතු කවරේද? යන්න ඔබතුමා සඳහන් කරන්නේද?

iv නොඑසේ නම් ඒ මන්ද?

10. ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා විසින්, ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති, හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) 14/57)

අ. බස්නාහිර පළාත් සභාවේ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ උපකාරක පංති, පෞද්ගලික පාසැල්, ජාත්‍යන්තර පාසැල් වශයෙන් ආයතන ලියාපදිංචි කර තිබේද?

ආ. එසේ නම් කොපමණ සංඛ්‍යාවක්ද?

ඇ. එම ආයතනවල නම්, ලිපිනයන් මොනවාද?

ඈ. අධ්‍යාපන උපකාරක ආයතන ලෙස ලියාපදිංචි වී ඇති ආයතනවලට ජාතික විභාග සඳහා දරුවන් ඉදිරිපත් කිරීමටත්, ජාතික විෂය මාලාව උගැන්වමින් සාමාන්‍ය පාසැල් ලෙස කටයුතු කිරීමටත්, හැකිද?

ඉ. මෙවැනි ආයතන පෞද්ගලික පාසල් ලෙස ක්‍රියාත්මක වන බව ඔබතුමා දන්නෙහිද?

ඊ. 1961 අංක 8 දරණ පනත, 1960 අංක 5 දරණ පනත පෞද්ගලික පාසැල් පවරා ගැනීමේ පනත යටතේ පෞද්ගලික පාසැල් ආරම්භ කළ නොහැකි බව ඔබතුමා දන්නෙහිද?

උ. එසේ නම් දැනට පවත්වා ගෙන යන මෙම ආයතන සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

ඌ. බස්නාහිර පළාතේ දරුවන් ඇතුලත් කිරීමේ අවිධිමත් ක්‍රමවේදය හා පාසැල් අතර පවතින විෂමතාවයන් මත අහිංසක දරුවන් මෙම ආයතනවල ගොදුරක් බවට පත් වන බව ඔබතුමා පිළිගන්නෙහිද ?

11. ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂනායකතුමා විසින්, ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය පරිවාස හා ළමාරක්ෂක සේවා, සහ සභා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) 14/58)

අ. i මීගොඩ ආයුර්වේද රෝහලේ භාවිතය සඳහා එක්ස්රේ යන්ත්‍රයක් මිලදී ගෙන ඇති බව දන්නේද?

ii ඒ සඳහා වැයකල මුදල කොපමණද?

iii එය මිලදීගත් දිනය කවදාද?

iv මෙම යන්ත්‍රය දැනට භාවිතයට ගෙන ඇද්ද?

v භාවිතයට ගෙන නොමැතිනම් ඒ මන්ද?

ආ. i මේ සඳහා පරමාණු බලශක්ති අධිකාරියේ අවසර ලබා ගත්තේද?

ii යන්ත්‍රය ක්‍රියා කිරීම සඳහා විකිරණ ශිල්පින් බඳවා ගන්නා ලද්දේද?

iii යන්ත්‍ර ක්‍රියාකරුවන් බඳවාගෙන නොමැතිනම් ඒ සඳහා ගන්නා ක්‍රියා මාර්ගය කුමක්ද?

ඇ. i X –RAY යන්ත්‍රය ස්ථානගත කිරීම සඳහා ඉදිකරන ලද කාමරය, රට ප්‍රමාණවත් නොවුයෙන්, කාමරය වෙනස් කිරිමට සිදු වු බව දන්නේද?

ii එසේ වුයේ කුමන හේතුවක් නිසාද?

ඈ. මෙම යන්ත්‍රය මිලදී ගැනිමේදි එකඟවූ වගකිම් කාල සීමාව, ඉකුත්විමේ දිනය සඳහන් කරන්නේද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ රැස්වීම් - I

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

යෝජනාව :

"2014.09.23 වන දින පැවැති, පළාත් සභා රැස්වීමේදි, හෝ ඉන් පෙර කිනම් තිරණයක් ගෙන තිබුණ ද, ඒ කිසිත් නොතකා, 2014.11.05 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදි එළඹුණු එකඟතාවයද, සැලකිල්ලට ගෙන, 2014 දෙසැම්බර් මස 01,02,03,හා 04 යන දිනයන්, '2015 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු' සඳහා වෙන් කළ දිනයන් විය යුතු, අතර 2014 දෙසැම්බර් මස 05 වන දිනය, සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක්, විය යුතු යැයි සළකා ක්‍රියා කළ යුතුය"

## සභාවේ රැස්වීම් - II

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

යෝජනාව :

"2015 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා කාර්ය පටිපාටි රීති අංක 50 (5) හි සඳහන් කාල පරාසයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතුය"

## සභාවේ රැස්වීම් - III

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට

යෝජනාව :

"අද දින (2014.11.18 දින) විසිර යෑමෙන් අනතුරුව, මෙම සභාව 2014 - දෙසැම්බර් මස 01 වන දින පෙ.ව. 9.00 ට රැස්විය යුතුය."

## X. සභාවේ කටයුතු

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

යෝජනාව :

"සභාවේ වැඩ කටයුතු සඳහා අද දිනය (2014.11.18 දින) පොදු කටයුතු වෙනුවෙන් වෙන් කළ දිනයක් යැයි සලකා ක්‍රියා කළ යුතුය"

## XI. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

## XII. පොදු කටයුතු

01. ගරු ප්‍රසන්න රණතුංග – ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප.) විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

*"2015 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය"*

*(මුදල් ප්‍රකාශය සභාවට ඉදිරිපත් කිරීම)*

02. ගරු ප්‍රසන්න රණතුංග – ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප.) විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

*"2015 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය"*

*( විසර්ජන ප්‍රඥප්තිය සභාවට ඉදිරිපත් කිරීම)*

## XIII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2014.11.05 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.